ලංසු සඳහා ආරාධනාවයි
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මහනුවර

1. සිංහල හා හින්දු අළුත් අවුරුදු උත්සවයේ හිසතෙල් ගෑමේ රාජ්‍ය මහෝත්සවය 2025.04.16 වන දින ශ්‍රී නාථ දේවාල පරිශ්‍රයේදී සිදු කිරීමට නියමිත අතර ඒ සඳහා මහනුවර දිස්ත්‍රික් ලේකම් සහ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් සුදුසුකම්ලත් අසාධු ලේඛනගත නොවූ ඒ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන සැපයුම්කරුවන්ගෙන් ලංසු ආරාධනා කරනු ලැබේ.

2. ලංසුකරුවන් තෝරා ගැනීමේදී මීට පෙර කර ඇති සාර්ථක සැපයීම් පිළිබඳව සැලකිල්ලට ගන්නා අතර ඒ පිළිබඳ විස්තර ලංසු සමග ඉදිරිපත් කළ යුතුය.ලංසුවට අදාල වැඩිමනත් විස්තර මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දුරකථන අංක 081-2233604 න් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී අමතා ලබාගත හැකිය.

3. ලංසු විස්තර www.Kandy.dist.gov.lk වෙබ් අඩවියේ ප්‍රසම්පාදන තිරුව මගින් බලාගත හැකි අතර ලංසු ලියවිලි සඳහා 2025.03.24 දින පෙ.ව. 10.00 දක්වා ගාස්තුව මුදලින් මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සරප් වෙත ගෙවා ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ලංසු ලියවිලි ලබාගත හැකිය.

4. ලංසු ලියවිලිවල ඉල්ලා ඇති තාක්ෂණික මූල්‍ය හා අනෙකුත් සුදුසුකම් සහිත ලේඛනවල සහතික කළ පිටපත් ලංසුව සමඟ ඉදිරිපත් කළ යුතුය.

5. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසුපත් පිටපත් දෙකකින් සකස් කර මුල් පිටපත හා අනුපිටපත වෙන් වෙන්ව නම් කර මුද්‍රා තබා එක කවරයක බහා 2025.03.24 දින පෙ.ව. 10.00 හෝ ඊට පෙර ලැබෙන සේ මහනුවර දිස්ත්‍රික් ලේකම් සහ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති,දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ,මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය ප්‍රධාන ගණකාධිකාරී නිල කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කල හැකිය. ලංසුපත් ඉදිරිපත් කරන කවරයේ ඉහල වම් කෙලවර අදාල ලංසුවේ නම සඳහන් කළ යුතුය.

6. ප්‍රමාද වී ලැබෙන සහ නියමිත උපදෙස් අනුව ඉදිරිපත් නොකරන'ලංසු ප්‍රතික්ෂේප කෙරේ.

7. පහත වගුවේ සඳහන් වටිනාකමින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සරප් වෙත මුදලින් කරන තැන්පත් කිරීමක් සඳහා වූ ලදුපත ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය.

උපලේඛනයෙ

| අනු අංකය | සැපයුම් | ලංසු සුරක්ෂණයේ වටිනාකම (ආපසු ගෙවන) | ලංසු ලියවිලි ගාස්තුව (ආපසු නොගෙවන) |
|---|---|---|---|
| | | මුදලින් (රුපියල්) | |
| 01 | ශ්‍රී නාථ මහා දේවාල පරිශ්‍රයේ සැරසිලි කටයුතු සිදු කිරීම. | 7,500.00 | 500.00 |
| 02 | සංග්‍රහ කටයුතු සිදු කිරීම. | 2,500.00 | 200.00 |

8.ලංසු භර ගන්නා වේලාව පසු වූ වහාම විවෘත කරනු ලැබේ.එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට පැමිණ සහභාගී විය හැකිය.

09.ලද ලංසු අතරින් යෝග්‍ය ලංසුවක් පිළිගැනිම හෝ අසම්පූර්ණව ඉදිරිපත් කර ඇති ලංසුව ප්‍රතික්ෂේප කිරිමේ සම්පූර්ණ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර,ප්‍රසම්පාදන කමිටුවේ තිරණය අවසන් තිරණය වේ.

10.මෙම උත්සවය රාජ්‍ය මහෝත්සවයක් වන බැවින් නියමිත ප්‍රමිතියෙන්හා ගුණාත්මක බවින් යුක්තව සිදු කළ යුතුය.

ඉන්දික උඩවත්ත
ප්‍රසම්පාදන කමිටුවේ සභාපති ,
දිස්ත්‍රික් ලේකම් /දිසාපති
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,මහනුවර

ඉන්දික උඩවත්ත
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
මහනුවර